www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# සිවිල් යුද්ධය අඛන්ඩව වර්ධනය වන තතු තුල ශ්‍රී ලංකාවේ ප්‍රධාන ගුවන් හමුදා කඳවුරකට ප්‍රහාරයක්

## Attack on major Sri Lankan airforce base as civil war continues to escalate

**සරත් කුමාර විසිනි**
**2007 මාර්තු 27**

දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානය සඳුදා අලුයම් කාලයේ උතුරු කොලඹ කටුනායක ප්‍රදේශයේ පිහිටි ප්‍රධාන ගුවන් හමුදා කඳවුරට එල්ල කරන ලද ප්‍රහාරයකින් ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ තිදෙනෙකු ඝාතනයට ලක් වූ අතර 16 දෙනෙක් තුවාල ලදහ. රටේ එක ම ජාත්‍යන්තර ගුවන් තොටුපල අසල පිහිටා ඇති මෙම කඳවුරට බෝම්බ කීපයක් හෙලීම පිනිස එල්ටීටීඊය සැහැල්ලු ගුවන් යානයක් යොදා ගත්තේ ය. දශක දෙකකට වැඩි කාලයක් තිස්සේ පැවත එන සිවිල් යුද්ධය තුල දී එල්ටීටීඊය සිය ප්‍රහාරයක් සඳහා ගුවන් යානයක් යොදා ගත්තේ ප්‍රථම වතාවට යි.

එල්ටීටීඊය ශ්‍රී ලංකා මිලිටරිය විමතියට පත් කල ප්‍රහාරයක් එල්ල කල ද ගුවන් හමුදාවේ ප්‍රහාරක ජෙට් ගුවන් යානා සහ හෙලිකොප්ටර අක්‍රිය තත්ත්වයට පත් කිරීමට හෝ විනාශ කිරීමට ප්‍රහාරය සමත් නො වී ය. සිදු වී ඇත්තේ සුලු හානියක් බවත් බෝම්බ එල්ල වූයේ ඉංජිනේරු සැපයුම් අංශයට බවත් ගුවන් හමුදා ප්‍රකාශක අජන්ත සිල්වා පැවසී ය. එහෙත් ආරක්ෂක කටයුතු සම්බන්ධ අනෙකුත් මූලාශ්‍රවලින් අඟවා සිටියේ නවතා තිබූ ගුවන් හමුදා හෙලිකොප්ටර දෙකකට දැඩි අලාභහානි සිදු වී ඇති බව යි.

2001 ජුලි මාසයේ මෙම සැපයුම් අංශයට ම එල්ල වූ ප්‍රහාරය මීට වඩා විනාශකාරී විය. නවතා තිබූ මිලිටරි සහ සිවිල් ගුවන් යානා විනාශ කිරීම සඳහා ජාත්‍යන්තර ගුවන් තොටුපලේ සහ ගුවන් හමුදා කඳවුරේ පැවති දැඩි ආරක්ෂක වාතාවරනය විනිවිද යාමට එල්ටීටීඊ සටන්කරුවෝ සමත් වූහ. ප්‍රහාරයෙන් සංචාරක ව්‍යාපාරය සහ රටේ ජාතික ගුවන් සේවාව කෙරෙහි බරපතල බලපෑමක් සිදු කෙරින. ජාතික ගුවන් සේවාවේ යානා සමූහයෙන් අඩක් අහිමි විය.

එල්ටීටීඊයට එරෙහිව තමන් යලි ඇරඹූ යුද්ධය කෙරෙහි පල කරන සියලු විරෝධතාවන් අවසානයකට ගෙන ආ යුතු යැයි ඉල්ලා සිටිමින් සඳුදා ප්‍රහාරයෙන් අනතුරුව ආන්ඩුව ජාතෝන්මාදී ගර්ජනයකින් යුතු නිවේදනයක් නිකුත් කලේ ය. "පටු දේශපාලනික වෙනස්කම් පසෙක ලා නැගී සිටින ලෙස" ද ආරක්ෂක හමුදා අපකීර්තියට පත් කිරීමෙන් සහ "එල්ටීටීඊ ත්‍රස්තවාදීන් ශක්තිමත් කිරීමෙන්" වලකින ලෙස ද එය සියලු පක්ෂවලින් දැඩිව ඉල්ලා සිටියේ ය. නිවේදනයෙන් මෙසේ කියැවුනි: "දේශය සියල්ලට ම වඩා උතුම් ය. කිසිදු දේශපාලනික අභිලාෂයක් ශ්‍රී ලංකාවේ ස්වෛරී භාවය සහ භෞමික අඛන්ඩතාව ඉක්මවා නොයා යුතු ය."

"නරුම" නව ප්‍රවනතාවක් යැයි තමන් හැඳින්වූ දෙය මුලිනුපුටා දැමීම සඳහා ජාත්‍යන්තර සහයෝගය ඉල්ලා ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ ද ආයාචනයක් නිකුත් කලේ ය. එහි දී ඔහු විකාර සහගත ලෙස කියා සිටියේ, එල්ටීටීඊයේ අසාර්ථක ගුවන් ප්‍රහාරය මගින් අනෙකුත් "ජාත්‍යන්තර ත්‍රස්තවාදී සංවිධානවලට" ඒ අනුව ක්‍රියා කිරීමට දිරි දෙන "ගෝලීය තර්ජනයක්" මතු වන බව යි. ඒ අනුව ගුවන් හමුදාව උතුරුදිග මන්නාරම් දිස්ත්‍රික්කයෙහි පිහිටි එල්ටීටීඊ පාලන ප්‍රදේශවලට පහර දෙමින් සිය පලිය ගත්තේ ය.

කොලඹ දී, අගනුවර ඇතැම් කොටස් හිතුමතේ වට ලා සෝදිසි මෙහෙයුමක් සිදු කිරීම සඳහා පූර්ව නිමිත්තක් ලෙස ආරක්ෂක හමුදා මෙම හදිසි ගුවන් ප්‍රහාරය යොදා ගත් අතර, "සැකකරුවන්" 40 දෙනෙක් අත් අඩංගුවට ගන්නා ලදහ. මේ කිසිදු රැඳවියෙකුට හදිසි ගුවන් ප්‍රහාරය සමග කිසිදු සම්බන්ධයක් නොතිබින. ඔවුහු වතුකරයෙන් පැමිනි, සිය අනන්‍යතාව සනාථ කර ගත නොහැකි වූ දෙමල ජනයා වූහ. ප්‍රදේශ පීරා යමින් කරන මෙවන් සෝදිසි මෙහෙයුම්වල එල්ලය වන්නේ රටේ දෙමල සුලුතරය තැති ගන්වා භීතියට පත් කිරීම යි.

එල්ටීටීඊය සම්බන්ධයෙන් ගත් කල, ගුවන් ප්‍රහාරය වනාහි සිය සටන්කරුවන්ගේ හීන වන ධෛර්යය නගා සිටුවීමේ අරමුනින් සැලසුම් කෙරුනු, අපේක්ෂා භංගත්වය නිසා සිදු කලා වූ ක්‍රියාවකි. පසු ගිය ජුලි මස දී ජනාධිපති මහින්ද රාජපක්ෂ ආක්‍රමනයට පිවිසීමට හමුදාවට නියෝග කල තැන් පටන්, මාවිල්ආරු, සාම්පූර් සහ වාකරේ යන නැගෙනහිරදිග ප්‍රදේශ අහිමි කර ගනිමින් එල්ටීටීඊය පරාජයන් මාලාවක් අත්විඳ තිබේ.

එල්ටීටීඊය මහත් විශ්වාසයක් තබා සිටි එක්සත් ජනපදය හා අනෙකුත් ප්‍රධාන බලවතුන්, 2002 සටන් විරාමය පැහැදිලිව ම උල්ලංඝනය කිරීමක් වූ ආන්ඩුවේ ක්‍රියාවන්ට නිහඬව සිටිමින් සහාය දී ඇත.

එල්ටීටීඊය විජයග්‍රාහී ලෙස සිය දෙමල ඊලම් ගුවන් හමුදාවේ (ටීඒඑෆ්) ඡායාරූප විදහා දක්වා තිබේ. ගුවන් යානා කොටස් වශයෙන් ශ්‍රී ලංකාවට හොරෙන් ගෙන විත් පසුව යලි එකලස් කරන ලද සැහැල්ලු, තනි ඇන්ජිමක් සහිත අහස් යානා යැයි විශ්වාස කරනු ලැබේ. යානයේ රාමුවේ යටි පැත්තේ සවි කර ඇති කුඩා වූ සහ තකහනියේ තනා ගත් බෝම්බ ඡායාරූපවලින් පෙන්නුම් කෙරේ. "මෙම කර්තව්‍යය සිදු කිරීමට තීරනය කලේ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ගුවන් ශක්තිය හීන කිරීමට" යැයි නිවේදනය කල එල්ටීටීඊයේ මිලිටරි ප්‍රකාශක රාසයියා ඉලන්දයන්, තවත් ගුවන් ප්‍රහාර එල්ල කරන බවට අනතුරු ඇඟවී ය.

එල්ටීටීඊයේ දේශපාලන අංශ නායක තමිල්චෙල්වම් ඉන්දියාව තුලින් ප්‍රකාශයට පත් වූ උත්සුකතාවන් සංසිඳුවීමට ප්‍රයත්න දැරී ය. එල්ටීටීඊයේ ගුවන් ශක්තිය "පොදුවේ ගත් කල කිසිදු රටකට, විශේෂයෙන් ඉන්දියාවට කිසිදු තර්ජනයක් එල්ල කරන්නක් නො වේ" යැයි ද "අපගේ ජනතාව ආරක්ෂා කිරීම එල්ල කොට ගෙන සිදු කරන ලද්දක්" යැයි ද ඔහු පැවසී ය.

දෙමල ඊලම් ගුවන් හමුදාව, ඊස්රායලයේ නිෂ්පාදිත කෆීර් යුද ගුවන් යානාවලින් සහ යුක්රේනයේ නිෂ්පාදිත මිග්-27 ප්‍රහාරක ජෙට් යානාවලින් සන්නද්ධව සිටින ශ්‍රී ලංකා ගුවන් හමුදාවට අභියෝග කල හැකි තත්ත්වයක නැත. පසු ගිය වසර පුරා, සිවිල් ජනයාට මෙන් ම එල්ටීටීඊ සටන්කරුවන්ට ද හානි පමුනුවමින් එල්ටීටීඊය යටතේ පවතින ප්‍රදේශවලට වෙඩි තැබීමට සහ බෝම්බ හෙලීමට මිලිටරිය මෙම යුද ගුවන් යානා නිරතුරුව යොදා ගත්තේ ය. මෙම ගුවන් ප්‍රහාර මගින් එල්ටීටීඊයට බරපතල මිලිටරි පසුබෑමක් අත් වූ අතර, එල්ටීටීඊ පාලනය යටතේ පවතින ප්‍රදේශවලින් පිටව යන සරනාගත ජන රැල්ලක් ඇති වීමට මග පෑදූ තැති ගැනීමට දායකත්වය සැපයින.

## නැගෙනහිර ආක්‍රමනය

මිලිටරිය සිය ආක්‍රමනකාරී මෙහෙයුම් දිගින් දිගට ම වර්ධනය කරමින් සිටියි.

මාර්තු 6 වන දා සිට දිවයිනේ නැගෙනහිරදිග පිහිටි එල්ටීටීඊයට අයත් අවසන් ප්‍රධාන බල කඳවුරුවලින් එකක් අල්ලා ගැනීම සඳහා ප්‍රධාන හමුදා ප්‍රයත්නයක් දැරෙමින් තිබේ. මඩකලපුව නගරයට කිලෝමීටර 40ක් නිරිතදිගින් පිහිටි තොප්පිගල යනු ත්‍රිකුනාමලය හා අම්පාර දිස්ත්‍රික්ක අතර පිහිටා ඇති, පුලුල්ව පැතිරුනු, ප්‍රධාන වශයෙන් කැලෑවෙන් වැසී ගිය ප්‍රදේශයකි. ජනවාරි මාසයේ දී නැගෙනහිරදිග වාකරේ නගරය අහිමි වීමෙන් අනතුරුව බොහෝ එල්ටීටීඊ සටන්කරුවන් එම ප්‍රදේශයට පලා ගිය බවට මිලිටරිය විශ්වාස කරයි.

මානව පලිහ 2 මෙහෙයුම ලෙස නම් කරන ලද ආක්‍රමනය 2002 සටන් විරාමය තවත් වතාවක් උල්ලංඝනය කිරීමකි. ජනාධිපති රාජපක්ෂ හා ඔහුගේ ආන්ඩුව කියා පාන්නේ හමුදාව "දෙමල ජනයා මුදා ගනිමින්" සහ එල්ටීටීඊය සිවිල් ජනයා "මානව පලිහක්" ලෙස යොදා ගැනීම වලක්වමින් සිටින බව යි. සැබවින් ම මිලිටරිය කරන්නේ ප්‍රදේශයේ මහජනයා කුලප්පු කිරීම සහ එල්ටීටීඊය හුදෙකලා කිරීම සඳහා වගවිභාගයක් නැති ගුවන් බෝම්බ ප්‍රහාර සහ කාලතුවක්කු ෂෙල් වෙඩි ප්‍රහාර හිතාමතා යොදා ගැනීම යි.

මෑත ම මෙහෙයුම වනාහි උතුරේ පිහිටි එල්ටීටීඊ බල කඳවුරු කෙරෙහි අවධානය යොමු කිරීමට ප්‍රථමයෙන් එල්ටීටීඊය නැගෙනහිරින් පලවා හැරීමේ පුලුල් මූලෝපායක කොටසකි. සිංහල අන්තවාදී ජාතික හෙල උරුමයේ (ජාහෙඋ) නියෝජිතයන් පිරිසකට පසු ගිය සතියේ ජනාධිපති රාජපක්ෂ කියා සිටියේ, අප්‍රේල් මස මැද (සිංහල-දෙමල) අලුත් අවුරුද්ද වන විට මුලු මහත් නැගෙනහිරේ ම පාලනය සියතට ගැනීමට මිලිටරිය බලාපොරොත්තු වන බව යි.

ආක්‍රමනය ආරම්භ වූ තැන් පටන් සියදහස් ගනන් සරනාගතයන් මඩකලපුවට ගලා විත් තිබේ. මාර්තු 19 දා ලෝක ආහාර වැඩ සටහන (ඩබ්ලිව්එෆ්පී) වාර්තා කලේ, කලින් සිදු කරන ලද මෙහෙයුම් අතරතුර දී 60,000ක් සිවිල් වැසියන් මඩකලපුවට පලා ගිය බව යි. දැන් තවත් පිරිමින්, ගැහැනුන් හා ලමුන් 95,000ක් ප්‍රදේශයට ලඟා වී තිබේ. ලෝක ආහාර වැඩ සටහනේ නිලධරයෙකු වන ටෝනි බැන්බරි මෙසේ අනතුරු ඇඟවී යෑ "අපට ඉතා ඉක්මනින් අලුත් ආධාර නොලැබුනොත් අප්‍රේල් මස අග වන විට අපට ප්‍රමානවත් තරම් ආහාර සැපයුම් නැතිව යාවි."

රිලීෆ්වෙබ් වෙබ් අඩවියට අනුව, පාසල් ආදේශක සරනාගත කඳවුරු බවට පත්ව තිබේ. බොහෝ සරනාගතයෝ එලිමහනේ හෝ ගස් යට ජීවත් වෙති. ආහාර, ජලය, සනීපාරක්ෂාව සහ අනෙකුත් මූලික පහසුකම්වල හිඟයක් පවතී. යුනිසෙෆ් ආයතනය පවසන පරිදි, වාසස්ථාන සොයා යන සරනාගතයන්ට කඳවුරෙන් කඳවුරට යාමට බල කෙරේ. ජනයා නැවතත් මුල් පදිංචි ප්‍රදේශවලට යැවීමට දරන ප්‍රයත්නය අනුව ආපසු වාකරේට යන ලෙස අවතැන් වූවන්ට පීඩනය යෙදීම සම්බන්ධයෙන් මානව හිමිකම් නිරීක්ෂකය (යමපබ ඍසටයඑී ඊඑජය) හා ඇම්නෙස්ටි ජාත්‍යන්තරය (පබිඑහ ෂබඑැරබ්එසදබ්ක) ආන්ඩුවට චෝදනා එල්ල කර තිබේ.

මිලිටරියේ මෙහෙයුම්වල ප්‍රධාන අවධානය නැගෙනහිරට යොමු වී පැවතිය ද පසු ගිය සති දෙක තිස්සේ උතුරුදිග ප්‍රදේශ කීපයක ද සටන් හට ගෙන ඇත. එල්ටීටීඊ පාලනය යටතේ පවතින වන්නි ප්‍රදේශයේ මායිමේ පවතින ඕමන්තේ දී මාර්තු 16 දා ඇති වූ ගැටුම්වලින් සොල්දාදුවන් පස් දෙනෙකු ඝාතනයට ලක් වූ අතර 23 දෙනෙක් තුවාල ලැබූහ. පසු ගිය සිකුරාදා එම ප්‍රදේශයේ දී ම ඇති වූ තවත් ගැටුමක ප්‍රතිඵලය වූයේ සොල්දාදුවන් නව දෙනෙකු මරනයට පත් වීම යි. යලිත් වතාවක්, මිලිටරිය ආක්‍රමනය වැලඳ ගත්තේ "පූර්ව හංග ප්‍රහාරයක්" ලෙස එය විසින් විස්තර කරන ලද දෙය වෙනුවෙනි.

ඊසානදිග මන්නාරම් දිස්ත්‍රික්කයෙහි ද සටන් හට ගෙන තිබේ. එල්ටීටීඊයට අනුව පසු ගිය බ්‍රහස්පතින්දා 300ක් පමන සොල්දාදුවන් ඔවුන්ගේ ප්‍රදේශයට ඇතුලු වූ අතර, දෙපාර්ශ්වය අතර කාලතුවක්කු සහ මෝටාර් වෙඩි හුවමාරු වන අතරතුරේ ඔවුහු ප්‍රදේශයේ සිවිල් වැසියන් "මානව පලිහක්" ලෙස යොදා ගැනීමට තැත් කලහ. මිලිටරි ප්‍රකාශක බ්‍රිගේඩියර් ප්‍රසාද් සමරසිංහ මෙම කියා පෑම් ප්‍රතික්ෂේප කල නමුත්, "ප්‍රදේශය තුල පවතින ත්‍රස්තවාදීන්ගේ කාලතුවක්කු සහ මෝටාර් ස්ථාපිතයන් අක්‍රිය කිරීමට" හමුදාව ප්‍රයත්න දැරූ බව ඔහු පිලිගත්තේ ය.

මිලිටරිය නව ප්‍රදේශ වෙත ප්‍රහාර එල්ල කරද්දී පවා, තම ආන්ඩුව 2002 සටන් විරාම ගිවිසුම මත ස්ථිරසාරව පිහිටා සිටින්නේ ය යන වංචාව ජනාධිපති රාජපක්ෂ දිගින් දිගට ම පවත්වා ගෙන යයි. මේ මස මුල දී, ඉහල පෙලේ ශ්‍රී ලාංකික ආරක්ෂක "මූලාශ්‍රයක්" ඒඑෆ්පී ප්‍රවෘත්ති ඒජන්සියට කියා සිටියේ "මීලඟ වසර දෙක සිට තුන" දක්වා වූ කාලය තිස්සේ යුද්ධය අඛන්ඩව පවතිනු ඇති බව යි. *සන්ඩේ ලීඩර්* පුවත්පතට අනුව මූලාශ්‍රය වූයේ ජනාධිපතිවරයාගේ සොහොයුරා වන ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ ය.

නාම මාත්‍රිකව ඊනියා ජාත්‍යන්තර සාම ක්‍රියා දාමයට නාමිකව සහාය දෙන නමුදු නව යුද්ධයට නිහඬව තල්ලුව දෙන බුෂ් පරිපාලනයෙන් ලැබෙන සහයෝගය මත රාජපක්ෂ ආන්ඩුව බරපතල ලෙස රඳා සිටී. දෙරට අතර පවතින සමීප සබඳතා මගින් මාර්තු මස මුල දී රටවල් දෙක අතර අත්පත් කර ගැනීමේ සහ හරස් සේවා ගිවිසුමක් (ඒසීඑස්ඒ) අත්සන් තැබීමට මග පෑදුනි. එමගින් එක්සත් ජනපද මිලිටරියට ශ්‍රී ලංකාව තුල පුලුල් නේවාසික සහායක් සම්පාදනය කෙරේ. මැද පෙරදිගට මෙන් ම දකුනු ආසියාවට ද මූලෝපායික ප්‍රවේශ ස්ථානයක් වන ශ්‍රී ලංකාව සමග එවන් ගිවිසුමක් ඇති කර ගැනීම සඳහා එක්සත් ජනපදය කාලයක් තිස්සේ පීඩනය යොදමින් සිටියේ ය.

ගිවිසුම අත්සන් කිරීමෙන් දින දෙකකට පසුව නියෝජ්‍ය එක්සත් ජනපද සහාය ලේකම් ස්ටීව් මාන් ශ්‍රී ලංකාවේ සංචාරයක යෙදී රාජපක්ෂ හා අනෙකුත් ශ්‍රී ලාංකික නිලධරයන් මුන ගැසුනේ ය. "මානව අයිතීන් ආරක්ෂා කිරීම" සහ "දේශපාලනික විසඳුමක්" සඳහා පවතින අවශ්‍යතාව පිලිබඳ වොෂින්ටනයේ වාගාලාප තොග පිටින් ඔහු පුනරුච්චාරනය කලේ ය. කෙසේ වුව, කොලඹ පැවති ප්‍රවෘත්ති සාකච්ඡාවක දී මාන් විසින් රාජපක්ෂගේ "ත්‍රස්තවාදයට එරෙහි යුද්ධයට" සහාය ද පල කල අතර, එල්ටීටීඊය තුල පරාජය කල යුතු "ශක්තිමත් මිලිටරි අංශයක්" පවතින බව ප්‍රකාශ කලේ ය.

2005 නොවැම්බරයේ දී යන්තමින් ජනාධිපති මැතිවරනය දිනා ගැනීමෙන් පසුව එල්ටීටීඊයට යටි වල කැපීමටත් එල්ටීටීඊය ප්‍රකෝප කර ගැනීමටත් නින්දිත සැඟවුනු යුද්ධයක් ගෙන යාමට මිලිටරියට ඉඩ දුන් රාජපක්ෂ, අනතුරුව පසු ගිය ජූලි මාසයේ දී මිලිටරි ආක්‍රමනයට නියෝග කලේ ය. 2005 අවසානයේ සිට මේ දක්වා කාලය තුල මිලිටරි කාර්ය මාන්ඩලිකයන්, එල්ටීටීඊ සටන්කරුවන් හා සිවිල් වැසියන් ඇතුලු 4,000කට වැඩි ජනයා මිය ගොස් තිබේ. 200,000ක් ජනයා අවතැන් වී තිබේ. මිලිටරියේ පිටුබලය ලබන ඝාතක කන්ඩායම් විසින් සිය ගනන් ජනයා පැහැර ගෙන ගොස් හෝ ඝාතනයට ලක් කොට තිබේ. ඔවුන්ගෙන් බොහෝ දෙනා දෙමල තරුනයන් ය. ආන්ඩුව සිය වාර්ගික යුද්ධය දිගින් දිගට ම කර ගෙන යන තත්ත්වය තුල මේ සංඛ්‍යා අඛන්ඩව ඉහල යනු ඇත.

© www.wsws.org